දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் - ஹம்பாந்தோட்டை
District Secretariat - Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"சௌபாக்கியமான எதிர்காலத்திற்காக
" For a prosperous future "

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට. 1ஆம் மாடி, றுஹுணு மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர ஹம்பாந்தோட்டை 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No | DSH/DPS/7/DCC/Report/2026 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2026.06.08 |

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2026.05.29</u>**

2026.05.29 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතන වල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය මා වෙත DCC Hambantota WhatsApp සමූහය වෙත හෝ dpshambantota@gmail.com වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව www.hambantota.dist.gov.lk දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබාගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

දුරකථන /ෆැක්ස් :- 0472256234
විද්‍යුත් ලිපිනය :- dpshambantota@gmail.com

පිටපත් -

1. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස.
2. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර මහාචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමා - කරු.දැ.ගැ.ස
3. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය - දැ.ගැ.ස.

දිස්ත්‍රික් ලේකම් / khtl;l nrayhsu / District Secretary - 047 2256235
අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / Nkyjpf khtl;l nrayhsu (epu;thfk;) / Additional District Secretary (Admin) - 047 2256232
අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / Nkyjpf khtl;l nrayhsu (fhzp) / Additional District Secretary (Land) - 047 2256002
ප්‍රධාන ගණකාධිකාරී / fzf;fhsu; / Chief Accountant - 047 2256246
අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / gzpg;ghsu; (tptrhak;) / Director (Agriculture) - 047 3628890
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / gzpg;ghsu;(jpl;lkply;) / Director (Planning) - 047 2256234
සහකාර දිස්ත්‍රික් ලේකම් / cjtp khtl;l nrayhsu; / Assistant District Secretary - 047 2256045
පරිපාලන නිලධාරී / epu;thf cj;jpNahfj;ju; / Administrative Officer - 047 2256285
කාර්යාලය / mYtyfk; / Office - 047 2256174
ෆැක්ස් / njhiy efy; / Fax - 047 2256235, 047 2256247
ඊ මේල්/ kpd;dQ;ry; / email : moha.dist.hambantota@gmail.com
වෙබ් අඩවිය / ,izaj;jsk; / Web site : www.hambantota.dist.gov.lk

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2026.05.29

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර මහාචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සියලුම දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.05.29 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු දෙනාම අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමිය විසින් පිළිගැනීමෙන් අනතුරුව, ගරු සභාපතිතුමා විසින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | **2026.03.12 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 1.1 | වැලි කැණීම් හේතුවෙන් පරිසර හානි සිදුවීම වළක්වා ගැනීම | නිත්‍යානුකූල බලපත්‍ර මගින් අනවසර වැලි කැණීම් හා ප්‍රවාහන කටයුතු සිදු කරන බවටත් මෙය වියිමත් කිරීමට කටයුතු සිදු කරන ලෙස ද මේ වන විට මොණරාගල දිස්ත්‍රික්කයේ ලබා දුන් බලපත්‍ර භාවිතා කරමින් තිස්සමහාරාම සහ ලුනුගම්වෙහෙර යන පොලිස් බල ප්‍රදේශ තුළ අනවසර වැලි කැණීම් සිදුවන බවත් නෙටොල්පිටිය ආදී ප්‍රදේශ වල ද මෙම කටයුත්ත සිදුවන බවත් ගාමිණීපුර ප්‍රදේශයෙන් ගොඩදාන වැලි සෙල්ලකතරගම ප්‍රදේශයේ ගබඩා කරන බවටත් කරුණු ඉදිරිපත් විය. එමෙන්ම මේ වන විට දිස්ත්‍රික්කය තුළ ප්‍රවාහන හා කැණීම් බලපත්‍ර 11ක් ලබා දී තිබෙන බවත් එනම්, පස් සඳහා කටුවන -1, ලුනුගම්වෙහෙර - 1, සූරියවැව - 1 සහ තංගල්ල - 1 වශයෙන් ද ගොඩවැලි සඳහා වීරකැටිය - 1, හම්බන්තොට - 1 වශයෙන් ද ගංගා වැලි සඳහා ලුනුගම්වෙහෙර 2, තිස්සමහාරාම - 3ක් වශයෙන් ලබා දී තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව වෙනම ම සාකච්ඡාවක් අදාල පාර්ශ්වයන් කැඳවා සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>සියලුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය<br><br>සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තංගල්ල |
| 1.2 | ධීවර වරායන් ආශ්‍රිතව ඩෙංගු වසංගතය ව්‍යාප්තිය | වැසි සහිත කාලගුණය සමඟ ඩෙංගු වසංගතය වැඩිවීමේ අවධානමක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | නවතා තිබෙන බෝට්ටු කඩිනමින් ඉවත් කිරීම සඳහා සාකච්ඡා කර විසඳුමක් ලබා ගන්නා ලෙසත් එම ගන්නා | සහකාර අධ්‍යක්ෂ ධීවර |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | ලද ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරන ලෙස සහ ප්‍රාදේශීය හා ග්‍රාමීය ඩෙංගු කමිටු සක්‍රීය කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | කළමනාකරු ධීවර වරාය |
| 1.3 | ආයුර්වේද රෝහල් තුළ භාවිතා නොකළ යකඩ ඇඳන් 50 ක් පැවතීම. | හම්බන්තොට ආයුර්වේද රෝහලේ පංචකර්ම වාට්ටුව සඳහා මෙම ඇඳන් ලබාදීමට යෝජනා වුව ද ඇඳන් වල පිරිවිතරවල වෙනස්කම් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | මෙම ඇඳන් පුරප්පාඩු පවතින ප්‍රාදේශිය රෝහල් වෙත ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | පළාත් ආයුර්වේද කොමසාරිස්<br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක |
| 1.4 | වලව ගඟේ මෝයකට ඇහිරීම නිසා ජල ගැල්මෙන් පහත් බිම් යටවීම වැළැක්වීම සඳහා ජලය බැස්සවීමේ ව්‍යාපෘතිය | මේ සම්බන්ධව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය ඉල්ලා ලිපි යැවූ බවටත් ප්‍රධාන කාර්යාලය වෙත එම ස්ථානයේ ක්ෂේත්‍ර සමීක්ෂණයට අදාල තොරතුරු යොමු කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | අදාල ආයතන සමඟ නියෝජ්‍ය ඇමතිතුමාගේ මූලිකත්වයෙන් සාකච්ඡා පවත්වා කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට<br>අධ්‍යක්ෂ වාරිමාර්ග හම්බන්තොට |
| 1.5 | ලුනුගම්වෙහෙර රාජපක්ෂ මාවතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් ව්‍යාපාරිකයෙක් සතු කර ගැනීම | රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීම යටතේ කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව පසුවිපරම් කඩිනමින් සිදු කරන ලෙසත් අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල ලිපියේ පිටපතක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | දිසාවන නිලධාරී හම්බන්තොට |
| 02. | **2026 වසරේ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ඉදිරිපත් කිරීම.** | | | |

2026 වර්ෂය සඳහා මෙම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 04 ක් වෙනුවෙන් (ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන - රු.මි.881.09, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - රු.මි.250, විමධ්‍යගත අයවැය වැඩසටහන රු.මි.70, නිල සෙවන සේවා පියස සඳහා රු.මි. 26.56) රුපියල් මිලියන 1227.68 ක් වෙන්ව ඇති බවත් දැනටමත් රු.මි. 1216.68 ක මුදලක් අප වෙත ලැබී පහත පරිදි ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී ඇති බවත් දැනුම් දෙන ලදී.

| ප්‍රා.ලේ.කො | ප්‍රජාශක්ති වැඩසටහන | | ග්‍රාමීය මාර්ග වැඩසටහන | | විමධ්‍යගත අයවැය වැඩසටහන | | නිල සෙවණ සේවා පියස | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා, රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. |
| කටුවන | 43 | 51.884 | 08 | 20.80 | 08 | 2.10 | - | - |
| වලස්මුල්ල | 10 | 11.811 | 11 | 20.80 | 05 | 2.10 | - | - |
| වීරකැටිය | 35 | 44.450 | 10 | 20.80 | 08 | 3.20 | - | - |
| ඕකෙවෙල | 18 | 25.00 | 10 | 20.80 | 03 | 5.00 | - | - |
| බෙලිඅත්ත | 28 | 34.220 | 07 | 20.80 | 09 | 7.20 | 05 | 11.75 |
| තංගල්ල | 72 | 94.320 | 02 | 21.00 | 22 | 8.10 | 10 | 14.84 |

වගකීම: දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට; අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන; දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්



විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | | | | තීරණය | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|---|
| අඟුණුකොලපැ. | 43 | 61.732 | 02 | 20.80 | 11 | 5.25 | - | - | |
| අම්බලන්තොට | 46 | 72.220 | 10 | 20.80 | 10 | 5.55 | - | - | |
| හම්බන්තොට | 30 | 60.000 | 09 | 20.80 | 02 | 5.00 | - | - | |
| සූරියවැව | 07 | 15.300 | 08 | 20.80 | 05 | 4.50 | - | - | |
| තිස්සමහාරාම | 28 | 54.477 | 05 | 21.00 | 14 | 5.7 | - | - | |
| ලුණුගම්වෙහෙර | 32 | 74.180 | 06 | 20.80 | 10 | 4.3 | - | - | |
| **එකතුව** | **392** | **599.59** | **88** | **250.00** | **108** | **59.00** | **15** | **26.59** | |
| 2.1 | විමධ්‍යගත අයවැය වැඩසටහන 2026 | මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයට දිස්ත්‍රික් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා, ගරු මන්ත්‍රීතුමන්ලා සහ ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන යටතේ දැනට රු.මි.70.7 ක් වෙන්ව පවතින බවත් ඒ සඳහා මේ වන විට රු.මි.59ක් වෙනුවෙන් ව්‍යාපෘති 133 ක් අනුමත කර ඒවා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කර ඇති බවටත් කරුණු වාර්තා කරන ලදී. තවදුරටත් යෝජනා ලබාදිය යුතු ගරු මන්ත්‍රීතුමන්ලා දැනුවත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. | | | | කඩිනමින් සංවර්ධන ව්‍යාපෘති සිදුකරන ලෙස උපදෙස් දෙන අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කර තිබූ යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | | | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.2 | ප්‍රජාශක්ති වැඩසටහන | දිළිඳුකම පිටුදැකීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන වෙනුවෙන් රු.මි. 881.09 ක් දිස්ත්‍රික්කයට වෙන්ව ඇති බවත් දැනටමත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් යෝජනා 392 ක් අනුමත කර තිබෙන බවත් එහි වටිනාකම රු.මි. 599.6ක් බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම වැඩසටහන සමාරම්භක අවස්ථාව ලබන මස 02 වන දින (2026.06.02) දිවයින පුරා ම ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බවත් මෙම දිස්ත්‍රික්කයෙන් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ම නියෝජනය වන පරිදි යෝජනා 39 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බවත් දිස්ත්‍රික් උත්සවය තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්නෙළුම්විල යායේ ප්‍රජා සංවර්ධන සභාවේ යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් ආරම්භ කිරීමට සැලැසුම් කර ඇති බවත් දැනුම් දෙන ලදී. | | | | කඩිනමින් සංවර්ධන ව්‍යාපෘති සිදුකරන ලෙස හා මෙම වැඩසටහන් සඳහා සහයෝගය ලබාදෙන ලෙසත් උපදෙස් දෙන ලදී.<br><br>තවද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කර තිබූ යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | | | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.3 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | දිස්ත්‍රික්කයට වෙන් කරනු ලැබූ රු.මි. 250ට අදාළව ව්‍යාපෘති 88ක් හඳුනාගෙන ඇති බවත් ඒවා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කර ඇති බවත් දැනුම් දෙන ලදී. තවද, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අමාත්‍යාංශය නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් පරිදි සංවර්ධනය කළයුතු අවම දුර මීටර් 100ක් ලෙස දැක්වුවත් වර්තමානයේ ඉන්ධන මිලෙහි සිදු වූ අනපේක්ෂිත ඉහළයාම නිසා ගාස්තු ඉහළ යාමෙන් මාර්ගය සඳහා වෙන් කර ඇති මුදල් උපයෝගි කරගෙන මීටර් 100 ක දුරක් සංවර්ධනය කිරීම ගැටළුවක් වී ඇති බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වාර්තා කරන බවත් දැනුම් දෙන ලදී. | මාර්ගයක් මීටර් 100ට අඩුවෙන් සකස් කිරීම ප්‍රායෝගික නොවන බවත් මේ දක්වා එකඟතාවක් නොමැති බැවින් ව්‍යාපෘතිවල මුදල් සංශෝධනය කර ගනිමින් මාර්ගයක අවම දුර මීටර් 100ක් වන ලෙස සකස් කරන මෙන් ද උපදෙස් දෙන ලදී.<br><br>තවද, දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කර තිබූ යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.4 | නිල සෙවණ හා සේවා පියස වැඩසටහන | මේ වන විට බෙලිඅත්ත හා තංගල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රු.මි. 26.59 ක ප්‍රතිපාදන අනුමත ව්‍යාපෘති 15 ක් සඳහා ලබා දී ඇති බවට දැනුම් දෙන ලදී. | කඩිනමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.5 | අනෙකුත් සංවර්ධන වැඩසටහන් | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ 2027 වර්ෂය වෙනුවෙන් මෙම දිස්ත්‍රික්කයේ කි.මී. 50 ක් සංවර්ධනය සඳහා යෝජනා ලබාදෙන ලෙස උපදෙස් ලැබී තිබූ බවත් එමෙන්ම රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ද 2027 වසරේ සංවර්ධනය කළයුතු මාර්ග පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලැබී තිබූ බැවින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වල අනුමැතිය යටතේ ඒ සඳහා යෝජනා ලබාගත් බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව එම යෝජනා අදාළ අමාත්‍යාංශ වලට යොමු කර ඇති බවත් ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලෙසත් දැනුම් දෙන ලදී.<br>තවද, දිස්ත්‍රික්කයේ අත්‍යවශ්‍ය පාලම් සහ අනතුරුදායක ස්ථාන සංවර්ධනය | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කර තිබූ යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වෙනුවෙන් පිළිවෙලින් රු.මි.100ක් බැගින් වෙන් කරන බවත් ඒ සඳහා ද යෝජනා ලබාදෙන ලෙස මහාමාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය මගින් කරන ලද දැනුම් දීම මත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා යෝජනා ලබාගෙන ඉන් රු.මි. 100ට ගැලපෙන ලෙස යෝජනා සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජනය වන පරිදි අමාත්‍යාංශයට යොමු කළ බවත් එම යෝජනා සඳහා ද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය අවශ්‍ය වන බවත් දැනුම් දෙන ලදී. | | |
| 2.6 | අඳුපැලැන පන්සල සඳහා පාලමක් සකස් කිරීම | අඳුපැලැන පන්සල වෙත ගමනාගමනය සඳහා පාලමක් සකස් කිරීමේ අවශ්‍යතාවය පවතින බවත් ඒ සඳහා රුපියල් ලක්ෂ 10ක මුදලක් වැයවන බවටත් කරුණු ඉදිරිපත් විය. | 2027 ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියට යෝජනාව ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තංගල්ල |
| 03. | පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ 2026 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය | සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර 2026.05.20 දිනට දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරන ලදී. | | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අමාත්‍යාංශය | අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 713.19 | 221 | 203 | 18 | 19.45 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 438.54 | 165 | 149 | 15 | 28.51 |
| ධීවර අමාත්‍යාංශය | 231.12 | 85 | 78 | 7 | 32.52 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 175.99 | 61 | 56 | 4 | 15.77 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 457.54 | 67 | 49 | 12 | 9.51 |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.1 | විසිතුරු මසුන් සම්බන්ධ ව්‍යාපෘති සඳහා අවධානය යොමු කිරීම | දකුණු පළාත තුළ එක් පුද්ගලයෙක් සඳහා රුපියල් ලක්ෂය බැගින් ලබා දී මිරිදිය මත්ස්‍ය වගා ව්‍යාපෘති ආරම්භ කර ඇති බවත් එහි දී හම්බන්තොට දිස්ත්‍රික්කය ඉතාම පසුගාමී තත්ත්වයක හා ප්‍රචලිත නොවීම දක්නට ලැබෙන බවට කරුණු ඉදිරිපත් විය. මේ සඳහා හේතුන් ලෙස කොවිඩ් කාලය තුළ දේශීය අළෙවි ජාලයේ අඩුවීමත් සමඟ පසු බැම සිදු වී තිබෙන බවත් දිස්ත්‍රික්කය තුළ 180 දෙනෙකු සඳහා විසිතුරු මසුන් ගොවිපළවල් ආරම්භ කර තිබෙන බවත් කටුවන, වලස්මුල්ල ආදී ප්‍රදේශ වල වසා දැමූ ගොවිපළවල් නැවත ආරම්භ කිරීමට කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | විසිතුරු මත්ස්‍ය ගොවීන්ගේ තාක්ෂණික ගැටළු වලට විසඳුම් ලබා දී ගොවිපළ සංවර්ධන කටයුතු සිදු කරන ලෙසත් 2026.06.04 වන දින ධීවර කමිටුවේ දී මේ පිළිබඳ දැනුවත් කරන ලෙස ද උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ත නිලධාරී |
| 04 | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු. | දිස්ත්‍රික් රෝහල තුළ හෙද නිලධාරීන්ගේ හිඟයක් පැවතීම හේතුවෙන් ගැටළු මතුවී තිබෙන අතර දැනට අනුමත හෙද නිලධාරීන් ප්‍රමාණය 613ක් බවත් ඉන් 40ක ප්‍රමාණයක් විදේශගත වී ඇති බැවින් 573 ක හෙද නිලධාරීන් ප්‍රමාණයක් සක්‍රිය සේවයේ යෙදී සිටී. රෝහල තුල ශෛල්‍ය වෛද්‍යවරු 08 ක් සිටින අතර මේ වන විට සක්‍රිය හෙද කාර්ය මණ්ඩලය රෝහලේ දෛනික ක්‍රියාකාරිත්වයට ප්‍රමාණවත් නොවන බවත් නව අනුමත හෙද කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 830ක් වන බවත් මේ මෙම ප්‍රමාණය කඩිනමින් රෝහල වෙත ලබාදෙන ලෙස කරුණු ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින ලදී. තවද, මෙම ප්‍රමාණය ද පාදක කර ගෙන තිබෙන්නේ 2017 සේවක සංඛ්‍යාව පදනම් කරගෙන (Approved Carder) බවත් එයද යාවත් කාලීන වියයුතු බවටත් දැනුම් දෙන ලදී.<br><br>ඒ අතර තාවකාලිකව මෙම අර්බුදයට පිළියම් ලෙස හෙද කාර්ය මණ්ඩලය ලබාදීම සිදුකරන බවට අතිරේක ලේකම් සමඟ සාකච්ඡා කල බවත් ඉදිරි මාස 06 තුළ ස්ථාන මාරු ක්‍රියාවලිය තුළින් හෙද කාර්ය මණ්ඩලය ලබා ගැනීමට හැකියාව පවතින බවටත් කරුණු ඉදිරිපත් විය | විදේශගත වූ ප්‍රමාණය සක්‍රිය සේවයේ නොමැති බවට සලකා එම ප්‍රමාණය කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම සිදුකළ යුතු බවට අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>රෝහල් අධ්‍යක්ෂ හම්බන්තොට මහ රෝහල |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 05 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | මෙම අවුරුද්දේ ගිය මාසය තුල වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (19) ක් වාර්තා වී තිබෙන්නේ මාර්ගගත ක්‍රමය ඔස්සේ මුදල් තැන්පත් කිරීම සම්බන්ධව බවත් විදේශගත වීමේ අරමුණින් තමන් සතු ඉඩම්, වාහන හා දේපළ ආදී වස්තූන් විකුණා මුදල් තැන්පත් කර වංචාකාරීන්ට රැවටී තිබෙන බවට කරුණු ඉදිරිපත් වූ අතර මෙවැනි වංචාකාරී පුද්ගලයින්ට නොරැවටෙන ලෙස ද වැඩිදුරටත් පැහැදිලි කරන ලදී. | මේ සියලු කාරණා සම්බන්ධව පරීක්ෂණ කටයුතු කඩිනමින් අඛණ්ඩව සිදු කරන ලෙස උපදෙස් දෙන ලද අතර රාජ්‍ය නිලධාරීන් ලෙස මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන ලෙස ද උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, තංගල්ල<br><br>සියලුම ආයතන ප්‍රධානීන් |
| 06 | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 6.1 | වීරකැටිය මොරගොම්මනේ කන්ද පොදු සුසාන භූමිය නිරවුල්කර ගැනීම | දෙබොක්කාව බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම ඉඩම දෙබොක්කාව බටහිර, දෙබොක්කාව නැගෙනහිර, වැකඳවල උතුර සහ තෙළඹුයාය යන ග්‍රාම නිලධාරී වසම් වල පදිංචි කරුවන් සුසාන භූමියක් ලෙස භාවිතා කරන බවට කරුණු ඉදිරිපත් විය. | කඩිනමින් මෙම භූමිය නිරවුල් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති ප්‍රාදේශීය සභාව වීරකැටිය<br><br>ප්‍රාදේශීය ලේකම් වීරකැටිය |
| 6.2 | වීරකැටිය වැකඳවල ග්‍රාම නිලධාරී වසමේ තේක්කවත්ත යාය නමැති රජය සතු ඉඩමෙන් කොටසක් ලබා ගැනීම | මෙම ඉඩම පොලිසියට පවරා දී ඇති අතර එහි කොටසක් වොලිබෝල් ක්‍රීඩා පිටියක් සඳහා වෙන් කර දෙන ලෙස වරින් වර ඉල්ලීම් සිදු කර ද වීරකැටිය පොලිස් ස්ථානාධිපති විසින් පොලිස් ස්ථානය සඳහා වෙන් කර දුන් ඉඩමෙන් කොටසක් ක්‍රීඩා පිටිය වෙත පවරා දීම සම්බන්ධයෙන් එකඟතාවයක් නොදැක් වූ අතර එම ඉඩම් කොටස දෙපාර්තමේන්තු පැවරුම් සහතිකයක් මගින් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇති බැවින් ඒකී ඉඩමෙන් කොටසක් ක්‍රීඩා පිටිය සඳහා ලබා ගැනීම ගැටළුකාරී වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමඟ සාකච්ඡා කර කඩිනමින් මෙම භූමිය නිරවුල් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති ප්‍රාදේශීය සභාව වීරකැටිය<br><br>ප්‍රාදේශීය ලේකම් වීරකැටිය<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල |
| 6.3 | ටෙලිකොම් කණුවක් මගින් අකුණු වැදීම නිසා වලස්මුල්ල රෝහලට හානි සිදුවීම. | වලස්මුල්ල රෝහල ආසන්නයේ ටෙලිකොම් කණුවක් ස්ථාපිත කර ඇති අතර එමගින් රෝහලට අකුණු සැර වැදීම තාක්ෂණිකව සිදුනොවන බවටත් රෝහලේ අර්ත් එක සහ වයරින් පද්ධතිය මෙන්ම අකුණු සන්නායකයක් සවි කිරීම සම්බන්ධව කරුණු ඉදිරිපත් විය. | රෝහලේ වයරින් පද්ධතිය පිළිබඳ සොයා බැලීම මෙන්ම අකුණු සන්නායකයක් කඩිනමින් සකස් කළ යුතු බවට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු ශ්‍රී ලංකා ටෙලිකොම් |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 6.4 | කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල්වල පවතින ලී බඩු අවශ්‍යතා ලේඛනය ඉදිරිපත් කිරීම | කලාප මට්ටමින් ලී බඩු අතිරික්තයක් පවතින අතර විහාරගල පන්සිය පනහ විද්‍යාලයට ලීබඩු හිඟයක් පවතින බවත් එනම්, ළමා මේස 68ක් සහ ළමා පුටු 68 ක හිඟයක් පවතින බවටත් කරුණු ඉදිරිපත් වූ අතර දකුණු පළාත් සභාව මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 10 ක මුදලක් පාසල් 66 ක් සඳහා ලී බඩු අලුත්වැඩියාව සඳහා වෙන් කර තිබෙන බවත් එම වැඩසටහන යටතේ කටුවන කොට්ඨාසයේ පාසල් 25ක් ආවරණය වී ඇති බවත් දන්වන ලදී. තවත් ප්‍රතිපාදන අවශ්‍ය වන්නේ නම් ලබාදීමට හැකියාවක් පවතින බවටත් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය. | කලාප තුල පවතින අතිරික්ත ලී බඩු පිළිබඳ අධ්‍යයනයක් සිදු කර අවශ්‍යතාව පවතින පාසල් වෙත ලබාදීමට කටයුතු කරන ලෙසත්, ලී බඩු අලුත්වැඩියා කිරීම සහ තවදුරටත් අවශ්‍යව පවතී නම් අමාත්‍යාංශය හරහා ලබාදීමට අදාල කටයුතු කඩිනමින් සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය දකුණු පළාත<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු |
| 6.5 | ස්ථාන මාරු ලබා යන වෛද්‍ය නිලධාරීන් වෙනුවට වෙනත් වෛද්‍ය නිලධාරීන් නොපැමිණීම හා ප්‍රාදේශීය මට්ටමේ රෝහල් පද්ධතිය පිළිබඳ විධිමත් අධීක්ෂණයක් සිදු නොවීම. | කටුවන රෝහල සඳහා වෛද්‍යවරුන් 08 දෙනෙකුගේ සේවය අවශ්‍යව පැවතියද දැනට වෛද්‍යවරුන් 04 ගේ සේවය පමණක් පවතින බවත් බාහිර රෝගී අංශය සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට දිනකට රෝගීන් 300 ඉක්මවා පැමිණෙන බවත් මේ හේතුවෙන් සායන කටයුතු සිදු කර ගැනීමට අපහසු බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>ප්‍රාදේශීය මට්ටමේ රෝහල්වල ගිලන් රථ රියදුරන්,කාර්ය මණ්ඩල පරිපාලනය, නඩත්තු කටයුතු ආදිය පිළිබඳව අධීක්ෂණ කටයුතු සක්‍රීය වියයුතු බවත් දිස්ත්‍රික්කයේ යම් රෝහල් වල උපකරණ හා ඖෂධ අවශ්‍ය පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | රෝහල් පද්ධතියේ පරිපාලනය සහ අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 6.6 | අම්බලන්තොට නගර සීමාවේ A2 මාර්ගය මංතීරු 4ක් වන සේ පුළුල් කිරීම | අම්බලන්තොට නගරය මාර්ග තදබදයකින් තොර, වායු දූෂණය අවම, දියුණු නගරයක් බවට පත් කිරීමේ අරමුණ සහිතව මල්පෙත්තාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල සිට අම්බලන්තොට වලව හන්දිය දක්වා පාලමත් සමඟ මංතීරු 4ක් වන සේ A2 මාර්ගය පුළුල් කිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් කරමින් ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවත් දන්වන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දෙමින් ඉදිරි කටයුතු කඩිනමින් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 6.7 | වළවේ ගඟේ ඉවුරු බාදනය වැලැක්වීම සඳහා පැති බැමි ඉදි කිරීම | ගංවතුර තත්ත්වයන් වලදී අම්බලන්තොට නගරය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රිදියගම මාර්ගයේ ගල්ලැලිතොට ජල සම්පාදන මණ්ඩලය අසළ එනම් ලවණ බාධකයේ සිට 1කණුව සීමාව දක්වා වලව ගඟ දෙපස ඉවුරු බාදනය වැළැක්වීම සඳහා පැති බැමි ඉදිකිරීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |
| 07 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 7.1 | ඓතිහාසික සිතුල්පව්ව රජමහා විහාරස්ථානයට ප්‍රවිශ්ය මාර්ගය සකස් කර ගැනීම | සිතුල්පව්ව රාජමහා විහාරයට සහ යාල වනෝද්‍යානයට ප්‍රවිශ්ය මාර්ගයක් ලෙස කතරගම සිට සිතුල්පව්ව දක්වා මාර්ගය භාවිතා කරන අතර මෙහි කි.මී.9.5 ක් පමණ වන කොටස පස් අතුරා සකස් කර ඇති බවත් වසරකට දෙපාරක් පමණ අළුත්වැඩියා කිරීමට සිදුවන බැවින් එමඟින් සිදුවන පරිසර හානිය ද ඉතා විශාලය. මේ සඳහා වනජීවී දෙපාර්තමේන්තුවේ ද උපදෙස් පරිදි කොන්ක්‍රීට් අතුරා සකස් කර ගැනීම සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන වෙත යොමු කරන ලෙස යෝජනා ඉදිරිපත් විය. | මේ පිළිබඳ ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම<br><br>සහකාර අධ්‍යක්ෂ වනජීවී (ඌව) |
| 7.2 | ව්‍යාපෘති භූමිය ප්‍රකාශිත අලි කළමනාකරණ රක්ෂිත භූමියෙන් පිටතට වැටෙන පරිදි සීමා මායිම් සලකුණු කර දෙන ලෙස ඉල්ලීම | සදර්න් ගෲප් සමාගම විසින් කලුගල් ආශ්‍රිත කර්මාන්තය වසර 30 ක පමණ කාලයක් සිදු කරන අතර මෙය පිහිටා තිබෙන්නනේ ප්‍රකාශිත අලි කලමණාකරණ කලාපයේ මායිමේ සිට මීටර් 140 ක් පමණ දුරින් බවත් මෙම ව්‍යාපෘති භූමිය ප්‍රකාශිත අලි කලමණාකරණ රක්ෂිතයෙන් පිටතට වැටෙන පරිදි සීමා මායිම් සලකුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | කඩිනමින් සීමා ලකුණු කිරීම සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී<br><br>සහකාර අධ්‍යක්ෂ වන සංරක්ෂණ |
| 7.3 | තංගල්ල නගරසභා ගිනි නිවන ඒකකය මඟින් ලබාදෙන ලද සේවා සඳහා සේවා ගාස්තු නොගෙවීම හා ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම | හම්බන්තොට දිස්ත්‍රික්කය තුල ඇති එකම ගිනි නිවන ඒකකය මෙය වන අතර මෙමඟින් ලබා දුන් සේවාවන් සඳහා 2017 වසරේ සිට මුදල් නොගෙවීම හේතුවෙන් විගණන ගැටළු හා අධිභාරයන්ට ලක්වී ඇති බවටත් අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පොලිසිය කතරගම ආදී වූ ආයතන මුදල් ගෙවීම පැහැර හැර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | 2017 වසරේ සිට මුදල් නොගෙවූ ආයතන සහ පුද්ගලයින් සඳහා ඔවුන් ගෙවිය යුතු හිඟ මුදල සහ එම මුදල් ලබා දිය යුතු දිනයන් ඇතුළත් කර ලිපි යවන ලෙසත් ඒ සම්බන්ධව මෙම කමිටුව දැනුවත් කළයුතු බවටත් උපදෙස් දෙන ලදී. | සභාපති තංගල්ල නගර සභාව<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස් |



විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.4 | ආලෝකපුර ඉඩම් ගැටළුව | ආලෝකපුර ටාගට් මාවතේ වරාය සඳහා ඉඩම් පවරාගත් කොටස කිසිම සංවර්ධන කටයුත්තක් සඳහා යොදා නොගෙන ඇති අතර මේ වනවිට ඝණ කැලෑවක් බවට පත්ව විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් සිදුවන බවත් අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව එම ප්‍රදේශයේ පදිංචි කරුවන්ට විකල්ප ඉඩම් හා වන්දි ලබා දී එම භූමිය වරාය අධිකාරිය වෙත පවරා ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | වරාය අධිකාරියෙන් මේ පිළිබඳ විමසීම් කරන ලෙසත් ඉදිරි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට වරාය අධිකාරිය නියෝජනය කරමින් නිලධාරියෙකු සම්බන්ධ කර ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |
| 7.5 | සීනිමෝදර මාදැල් ධීවර වරායට අනවසරයෙන් මංකොල්ලකෑම සඳහා ඇතුළු වීම | 2026.01.30 වන දින පෙ.ව. 10 ට පමණ අනවසරයෙන් සහ බලහත්කාරයෙන් සීනිමෝදර මාදැල් ධීවර වරායට ඇතුළු වී මසුන් ඇල්ලීම සිදු කර ඇති බවත් මේ පිළිබඳ මෙතෙක් කිසිදු පරීක්ෂණයක් සිදු කර නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. | නීතිවිරෝධී ලෙස කටයුතු කළ පුද්ගලයන් සඳහා දේශපාලන තරාතිරමකින් තොරව නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ ධීවර |
| 7.6 | හම්බන්තොට නගරයේ ධීවර වරාය පුළුල් කිරීමේ දී පාරම්පරික ධීවරයින් 05 දෙනෙකුට අයත් දැල්පලෙන් ඔවුන් ඉවත් කිරීම සහ විසඳුමක් නොලැබීම | හම්බන්තොට ධීවර වරාය පුළුල් කිරීම සඳහා එල්.ජේ.ඉසදීන්, අයි.එම්. ඉල්හාර් ඇතුළු පාරම්පරික ධීවරයන් පස් දෙනෙකුට අයත්ව තිබූ දැල්පල බලහත්කාරයෙන් ලබාගෙන ආදේශ ධීවර වරායක් ලබාදෙන පොරොන්දුව මත වන්දියක් ලෙස ආම්පන්න කිසිවක් නොමැතිව ධීවර යාත්‍රා ලබා දී ඇති අතර වරාය ඉදිකිරීමෙන් පසුව ස්වාභාවිකව නිර්මාණය වුණ ධීවර වරාය නීත්‍යානුකූල කර දෙන ලෙස ඉල්ලීම කල ද 2026 වසරේ ධීවර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියකින් මොවුන්ට මෙම ස්ථානයෙන් ඉවත් වන ලෙස දැනුම් දී ඇති බවත් ඒ සඳහා අවුරුද්දක කාලයක් ධීවරයන් විසින් ඉල්ලා තිබුන ද එය නොසලකා දැල් හිමියා ඇතුළු සේවකයන්, ආම්පන්න සමඟ අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | නීතිමය තත්ත්වය අනුව කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| 7.7 | ගොන්නෝරුව සිවරජගම ගම්මානයේ නිවාස 07 ක පදිංචිකරුවන් හට නිවාස හා ප්‍රවේශ මාර්ග අහිමිවීමේ අවදානමක් පැවතීම | උදාගම්මාන සංකල්පය යටතේ 2017 වසරේ නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස 30 ක් ඉදිකර දී ඇති හම්බන්තොට ගොන්නෝරුව සිවරජගම ගම්මානයේ නිවාස 07ක පදිංචිකරුවන්ට ගරු අධිකරණයෙන් ලබා දී ඇති නඩු තීන්දුවක් හේතුවෙන් නිවාස සමඟ ඉඩම් අහිමි වීමේ අවදානමක් පවතින බවත් එමෙන්ම සියලුම නිවාසවල | මේ පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>දිස්ත්‍රික් කළමනාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පදිංචිකරුවන්ට ප්‍රවේශ මාර්ගය ද අහිමිවීමට සිදුවිය හැකි බැවින් අධිකරණයෙන් ඉඩම හිමි වූ තැනැත්තිය සමඟ සාකච්ඡා කොට ඇයගේ ඉඩම සඳහා වෙනත් විකල්ප ක්‍රමවේදයක් සැකසීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | | |
| 08 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | | | |
| 8.1 | හ/ඉහළකුඹුක්වැව ප්‍රාථමික විද්‍යාලය වසා දැමීම. | හම්බන්තොට කලාපයේ සූරියවැව කොට්ඨාසයට අයත් මෙම පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව 16 ක් දක්වා පහළ වැටීම හේතුවෙන් එම දරුවන් මහගල්වැව කනිෂ්ඨ විද්‍යාලය සහ මීගහජඳුර මහ විද්‍යාලය වෙත ඇතුලත් කරගත් බවත් ගුරුභවතුන් ද සේවා අවශ්‍යතා මත වෙනත් පාසල් සඳහා ස්ථාන මාරු කරන ලද අතර එබැවින් මෙම පාසල වසා දැමීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවට දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට |
| 8.2 | දිස්ත්‍රික්කය තුළ සීමා ලකුණු කිරීමට යෝජිත ධීවර තොටුපල වල නාම ලේඛනය ඉදිරිපත් කිරීම | ධීවර තොටුපලවල සීමා සලකුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්කයේ හඳුනාගන්නා ලද ධීවර තොටුපල වල සීමා ලකුණු කිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා යෝජිත නාම ලේඛණය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය අවශ්‍ය බවට දැනුම් දෙන ලදී. | කඩිනමින් සීමා ලකුණු කිරීම සිදුකරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි |
| 8.3 | කුඩා බිබුළ රක්ෂිතයක් ලෙස ගැසට් කිරීම සඳහා නිර්දේශ ඇතුලත් වාර්තාව ඉදිරිපත් කිරීම | Clean Sri Lanka වැඩසටහන යටතේ ජල උල්පත් සංවර්ධනය කිරීමට අදාලව වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බිබිළ දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුඩා බිබිළ රක්ෂිතයක් ලෙස ගැසට් කිරීම සඳහා නිර්දේශ ඇතුලත් වාර්තාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් වීරකැටිය |
| 8.4 | බැරගම්විල උස්සාන ජල ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බැරගම්විල උස්සාන ජල ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවට දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |
| 09 | සාකච්ඡා කරන ලද වෙනත් කරුණු හා පසුව ලැබුණු ලිපි | | | |
| 9.1 | 2026 දිවියට සවියක් නිවාස වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීමට ඉඩම් කොටස් | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන යටතේ තෝරා ගන්නා ප්‍රතිලාභීන්ට නිවාස අදියර මට්ටමින් | එම පුද්ගලයන්ට මෙම ඉඩම් කොටස් ලබා දීමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යනය කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් කළමනාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ලබාදීම සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ජීවත් වී සමාජගත වූවන් හා අවදානමට ලක් වී ඇති දරුවන්ගේ නාම ලේඛනය ඉදිරිපත් කිරීම | ඉදිකිරීම, ප්‍රතිලාභීන්ට ඉඩම් ලබාදීම සිදු කරන අතර මේ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ජීවත් වී සමාජගත වූ හා අවධානමට ලක් වී ඇති දරුවන්ගේ නාම ලේඛනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. | | |
| 9.2 | තිස්සමහරාම පූජා නගරය තුළ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි වැඩි ජල ධාරිතාවයකින් යුත් ජල ටැංකියක් නගරය ආසන්නයේ ඉදිකිරීම. | ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය ආධාර යටතේ වැඩි ජල ධාරිතාවයක් ගබඩා කළ හැකි ජල ටැංකියක් ඉදිකිරීම සඳහා දැනට තිස්සමහාරාම නගරයේ සේසිත ගොඩනැගිල්ල පිහිටි ඉඩමට යාබඳ ඉඩමෙන් පර්චස් 40ක බිම් කොටසක් ලබාදෙන ලෙස ජලසම්පාදන මණ්ඩලය ඉල්ලීම් කර ඇති බවත් මේ වන විට ජාතික ජලසම්පාදන මණ්ඩලය විසින් ජල ටැංකිය ඉදිකිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, අදාළ අංශ සමඟ ගිවිසුම්ගතව ඇති බවත් කඩිනමින් ආරම්භ කළ යුතු ව්‍යාපෘතියක් බැවින් අදාල පාර්ශ්ව සමඟ ස්ථානීය පරීක්ෂාවක් ද සිදුකර තිබෙන බවට හා එහිදී මෙම ඉඩම සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් ඇති බවට කරුණු ඉදිරිපත් විය. | සියලු පාර්ශ්ව කැඳවා 2026.06.02 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මේ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 9.3 | සහිරා විද්‍යාලයට ආසන්නයේ පවතින හම්බන්තොට රික්‍රියේෂන් ග්‍රවුන්ඩ් නැමති භූමිය නිලවශයෙන් පාසලට ලබා දෙන ලෙස ඉල්ලීම. | හම්බන්තොට නගරයේ එකම දෙමළ මාධ්‍ය පාසල වන මෙම පාසල සඳහා ස්ථිර ක්‍රීඩා පිටියක් නොමැති වීම හේතුවෙන් සිසුන්ට පුහුණුවීම් සඳහා කි.මී.3 ක් පමණ දුරින් පිහිටි පොදු ක්‍රීඩාංගනය වෙත උපකරණ ද රැගෙන යාමට සිදුවීමත්, මුදල් ගෙවා එය වෙන් කර ගැනීමට සිදුවීමත් හේතුවෙන් මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කළ පසු අමාත්‍යාංශය විසින් සුදුසු භූමියක් නිර්දේශ කරන ලෙස දැනුම් දී ඇති බවත් ඒ සඳහා පාසලට නුදුරින් පිහිටා ඇති හම්බන්තොට රික්‍රියේෂන් ග්‍රවුන්ඩ් භූමිය ක්‍රීඩා පිටිය ලෙස නිල වශයෙන් පවරා දීමට අවශ්‍ය නිර්දේශය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු විසින් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය මේ සඳහා ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>විදුහල්පති සහිරා විද්‍යාලය හම්බන්තොට<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට |

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 9.5 | රතු කුරුස සංවිධානයට අයත් පිරවුම්හල සී/ස හම්බන්තොට විවිධ සේවා සමූපකාර සමිතිය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීම | හම්බන්තොට නගරයේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව නියෝජිත ධූරය ලද සමූපකාර සමිතියේ පිරවුම්හල 2004.12.26 දිනැති සුනාමි ව්‍යසනයෙන් විනාශකාරී තත්ත්වයට පත් වූ බවත් මෙම පිරවුම්හල නැවත ස්ථාපිත කිරීමට නියමිතව තිබිය දී රතුකුරුස සංවිධානයට පවරා දුන් බවට ත් වර්තමානයේ ද හම්බන්තොට නගරයේ පිහිටි පිරවුම්හල යුදුසු පරිදි නවීකරණය කිරීමට ගැසට් නිවේදනය බාධාවක් ව පවතින බැවින් රතුකුරුස සංවිධානය සතු පිරවුම්හල නීත්‍යානුකූලව සමූපකාර සමිතිය වෙත පවරා දීමට කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | නඩු තීන්දුව අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>සාමාන්‍යාධිකාරී සී/ස හම්බන්තොට විවිධ සේවා සමූපකාර සමිතිය |
| 9.6 | නව පිරවුම්හලක්, නව ග්‍රාමීය බැංකු ශාඛාවක් සහ සමූපකාර වෙළඳසැලැක් ස්ථාපිත කිරීම සඳහා බිම් කොටසක් ලබා ගැනීම. | හම්බන්තොට විවිධ සේවා සමූපකාර බල ප්‍රදේශයට අයත් සූරියවැව ද ආවරණය වන පරිදි නව පිරවුම්හලක්, නව ග්‍රාමීය බැංකු ශාඛාවක් සහ සමූපකාර වෙළඳසැලැක් ස්ථාපිත කිරීම සඳහා සූරියවැව අඩි 100 පාරේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් පර්චස් 100 බිම් කොටසක් දීර්ඝකාලීන බදුකරයක් යටතේ සමූපකාර සමිතිය වෙත පවරා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | මෙ සම්බන්ධව සලකා බලන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති හම්බන්තොට ප්‍රාදේශීය සභාව<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු මහවැලි අධිකාරිය |
| 9.7 | රන්න නගර සංවර්ධන සැලැස්මට අනුව රන්න ප්‍රාදේශිය රෝහල වෙනත් ස්ථානයක ප්‍රතිෂ්ඨාපනය කිරීමට අදාල යෝජනාව අනුමැතියට ඉදිරිපත් කිරීම | රන්න ප්‍රාදේශීය රෝහල වෙනත් ස්ථානයක ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධව යෝජනාවට අදාල නිර්දේශ ඇතුලත් වාර්තාව සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවට ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදුන් අතර අමාත්‍යාංශයට දැනුම් දීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රාදේශීය ලේකම් තංගල්ල |
| 9.8 | දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ අනුමත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | වලව පෙරපාසලේ වැසිකිළිය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | සභාපති ප්‍රාදේශීය සභාව හම්බන්තොට |

නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 9.9 | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උඩුකිරිවිල වැව් කණ්ඩිය මත ඉදිකරන ලද බහුකාර්ය ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම. | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උඩුකිරිවිල වැව් කණ්ඩිය මත ඉදිකරන ලද ඇවිදින මංතීරුවේ ව්‍යාපෘතිය, උඩුකිරිවිල බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සහ නව නිර්මාණ නිපැයුම් යටතේ සෞඛ්‍යාරක්ෂිත හලර් යන්ත්‍රයක් මිලදී ගැනීම යන ව්‍යාපෘති යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | සභාපති ප්‍රාදේශීය සභාව වීරකැටිය<br><br>ප්‍රාදේශීය ලේකම් වීරකැටිය |
| 9.10 | 2026 වර්ෂයේ නව විදුලිවැට ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යාල නිමලව කුමාරයාගේ මාවත නව විදුලි වැට කි.මි. 07ක දුර ප්‍රමාණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාගැනීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 9.11 | AJR තිලක් රෝහණ කළුගල් ව්‍යාපෘතිය විශාල කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. | දැනට පවතින කළුගල් වල මගින් නිෂ්පාදනය වන ගල් ප්‍රමාණය දැනට පවතින ව්‍යාපෘති වලට සැපයුම් කිරීම ප්‍රමාණවත් නොවන හෙයින් මෙම ගලට යාබදව ඇති හෙක්ටයාර් 07ක පමණ පැතිර ගිය කළුගල සහිත ඉඩම ලබාදෙන ලෙසත් තවද එහි සෝලා ව්‍යාපෘතියක් දැනට ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති බැවින් එය ගල් නිධියෙන් බැහැරව ඉදිකරන ලෙස ත් ඉල්ලා සිටින ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |
| 9.12 | මත්තල ගුවන් තොටුපල පිවිසුම් මාර්ගයේ අනාරක්ෂිත බව | මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල වෙතට පිවිසුම් වන මාර්ගයන් ඉතා අනාරක්ෂිත බවත් විශේෂයෙන්ම රාත්‍රී කාලයේ මෙම මාර්ග වල විදේශිකයන් රැගත් වාහන මෙන්ම කාර්ය මණ්ඩලය ගමන් කරන අතර මෙම මාර්ගවල අලි ඇතුන් ගැවසෙන බැවින් ඉතා අනාරක්ෂිත තත්ත්වයකට මුහුණ දී ඇති නිසා මෙම මාර්ගය වල වීදි ලාම්පු ආලෝක මත් කර මාර්ගය එලිපෙහෙළි කර ආරාක්ෂිත බව තහවුරු කරන ලෙස කරුණු ඉදිරිපත් විය. | මෙ සම්බන්ධව ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ ලිඛිතව ඉල්ලීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත සහ මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය සභාව ආදී අදාල ආයතන වෙත ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | කළමනාකරු මත්තල ගුවන්තොටුපළ |
| 9.13 | පොදු ස්ථානවල අනතුරුදායක ගස් ඉවත් කිරීම | පාසල්, රෝහල්, පන්සල් හා විවිධ පොදු ස්ථාන ආශ්‍රිතව අනතුරුදායක ගස් පවතින බවටත් ඒවා ඉවත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ පොදු තීරණයක් ගැනීමේ වැදගත්කම ඉදිරිපත් කරන ලදී. | අදාල ආයතන වල ප්‍රතිපාදන මඟින් ගස් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සියළුම ආයතන ප්‍රධානීන් |
| 9.14 | හම්බන්තොට සංචාරක බංගලාව අවශ්‍යතාවයක් පවතින ආයතනයක් වෙත පැවරීම | මෙකී බංගලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර අවශ්‍යතාවයක් පවතින සුදුසු රාජ්‍ය ආයතනයක් ඉදිරිපත් වන්නේනම් එම ආයතනය වෙත විධිමත්ව පැවරීම සිදු කළහැකි බවට කරුණු ඉදිරිපත් විය. | සංචාරක බංගලාවක් සඳහා හඳුනාගත් රජයේ වැඩ පිළිවෙලක් පවතින බවත් ඉදිරියේ දී ඒ සම්බන්ධව තීරණයක් ගත හැකි බවටත් දැනුවත් කරන ලදී. | සහකාර ඉඩම් කොමසාරිස් අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 9.15 | ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන හා දේශගුණ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය - (IRDCRP) | මෙම ව්‍යාපෘතියට අදාලව බඳගිරිය ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් රඹුක්වැව ග්‍රාම නිලධාරී වසමේ වෙහෙරගොඩ වැව සංවර්ධනය කිරීමට වඩා පැලැස්ස වැව සංවර්ධනය කිරීම ප්‍රතිඵලදායක වන බවත් වෙහෙරගොඩ හා පැලැස්ස යන වැව් දෙකම සංවර්ධනය කිරීමේ හැකියාවක් පවතී නම් ශක්‍යතා අධ්‍යනය කර ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇති අතර ඒ සඳහා අදාල පාර්ශ්වයන්හි එකඟතාව ලබා ගැනීම සඳහා කරුණු ඉදිරිපත් කරන ලදී. | මේ පිළිබඳ ශක්‍යතා අධ්‍යනය කර වාර්තා කරන ලෙස උපදෙස් දෙන ලදී. | සහකාර කොමසාරිස් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හම්බන්තොට |

අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති මහාචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමා විසින් මහජනතාවගෙන් වැටුප් ලබන පිරිසක් වන අප තමන්ට වඩා රට පෙරට යන අදිටනින් කටයුතු කළයුතු බවටත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගන්නා තීන්දු තීරණ පිළිබඳව පසු විපරම් කිරීමට යාන්ත්‍රණයක් සිදුකිරීමට බලාපොරොත්තු වන බවත් එය අප සැමගේ වගකීමක් බවටත් වැඩිදුර අවධාරණය කරමින් පස්වරු 2.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය
2026 ජූනි මස ..08..................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.